# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011

## ඡන්දය ප්‍රකාශ කිරීම සහ මනාප ලකුණු කිරීම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක්

### ඡන්ද පත්‍රිකා ආදර්ශ ආකෘතිය

| | | | | | |
|---|---|---|---|---|---|
| “ අ ” පක්ෂය | | | | ලකුණ | |
| “ ආ ” පක්ෂය | | | | ලකුණ | |
| “ ඇ ” පක්ෂය | | | | ලකුණ | |
| ස්වාධීන කණ්ඩායම 1 | | | | ලකුණ | |
| ස්වාධීන කණ්ඩායම 2 | | | | ලකුණ | |
| ස්වාධීන කණ්ඩායම 3 | | | | ලකුණ | |
| 1 | | | 11 | | |
| 2 | | | 12 | | |
| 3 | | | 13 | | |
| 4 | | | 14 | | |
| 5 | | | 15 | | |
| 6 | | | 16 | | |
| 7 | | | 17 | | |
| 8 | | | 18 | | |
| 9 | | | 19 | | |
| 10 | | | 20 | | |

1. ඉහත දැක්වෙනුයේ ඡන්ද පත්‍රිකාවක ආදර්ශයක් පමණි.

2. තරග කරන දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම් වල නම්, ඒවායේ ලකුණු සමග ඉහළ කොටසේ දක්වා ඇත. එක් එක් ලාංඡනයක් ඉදිරිපස හිස් කොටුවක් තිබේ. මෙයින් ඕනෑම කොටුවක ඔබේ ඡන්දය ලකුණු කිරීමට හැකිය. ඡන්දයක් ලකුණු කිරීමේදී ඔබ කැමති ලාංඡනය ඉදිරිපස හිස් කොටුවේ **කතිරයක් (X)** සළකුණු කළ යුතුය.

3. ඡන්ද පත්‍රිකාවේ පහත ඇති කොටසෙහි එක් එක් අපේක්ෂකයාට වෙන් කරන ලද අංකය ඇතුළත් කොටුවක් හා ඊට දකුණු පසින් හිස් කොටු දෙකක් ඇත. අංකය ඇතුළත් කොටුවෙහි මෙන්ම දකුණුපස ඇති හිස් කොටුවල තුනකට වැඩි නොවන ගණනක් දක්වා, ඔබගේ මනාප සඳහා **කතිර (X)** ලකුණු කිරීමට හැකිය. මනාප තුනම එක් අපේක්ෂකයකුට හෝ මනාප දෙකක් එක් අපේක්ෂකයෙකුට හා එක් මනාපයක් තවත් අපේක්ෂකයෙකුට හෝ මනාප තුන අපේක්ෂකයන් තිදෙනකු අතරේ බෙදී යන පරිදි හෝ මනාප ලකුණු කළ හැකිය.

4. ඡන්දයක් සළකුණු කර නොමැති එහෙත් මනාප පමණක් සළකුණු කර ඇති ඡන්ද පත්‍රිකාවක් වලංගු නොවේ. එහි කිසිදු වටිනාකමක් නොමැති අතර, එය ප්‍රතික්ෂේප කරනු ඇත. එබැවින්, ප්‍රථමයෙන් ඔබ කැමති පක්ෂයක හෝ කණ්ඩායමක ලකුණ ඉදිරියේ ඇති හිස් කොටුවෙහි **කතිරයක් (X)** සටහන් කර ඡන්දයක් ලකුණු කිරීමත්, ඉන්පසුව ඔබගේ කැමැත්ත පරිදි මනාප ලකුණු කිරීමත් සුදුසු බව සිත්හි තබා ගන්න.

**දයානන්ද දිසානායක,**
**මැතිවරණ කොමසාරිස්**

මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය.

2011.03.04